2025-01

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Resource Centre, De Mazenod College

වර්ෂ අවසාන ඇගයීම - 2024 - 2025
ஆண்டிறுதி மதிப்பீடு - 2024 - 2025
Year End Evaluation - 2024 - 2025

№ 008105

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
| --- | --- | --- | --- |
| 06 | කතෝලික ධර්මය | I, II | 2 hours |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. පාපයට වැටුණු මිනිසා ගැලවීම සඳහා ........................................ තෝරා ගන්නා ලදි. මෙහි හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
   i. මිසර ජනතාව
   ii. ඊශ්‍රායල් ජනතාව
   iii බැබිලෝනියානු ජනතාව
   iv. ග්‍රීක ජනතාව

2. සුබාරංචියක් ලියන ලද එකම අන්‍ය ජාතිකයා කවු ද?
   i. ශු. මතෙව් තුමා ය.
   ii. ශු. මාක් තුමා ය.
   iii. ශු. ලූක් තුමා ය.
   iv.ශු. ජොහන් තුමා ය.

3. මැවීමේ පුවතට අනුව පස්වන දින දෙවියන් වහන්සේ මවන ලද්දේ,
   i. පක්ෂීන් හා මසුන් ය.
   ii. දවාල හා රාත්‍රිය ය.
   iii. අහස හා ජලය ය.
   iv. ඉර හඳ හා තාරකා ය.

4. ජේසුස් වහන්සේට "ජේසුස්" යන නම තබන බවට දිවැස් වැකි පවසන ලද දිවැසිවරයා කවුද?
   i. ජෙරමියා දිවැසිවරයා
   ii. යෙසායා දිවැසිවරයා
   iii. එලියා දිවැසිවරයා
   iv. එසකියෙල් දිවැසිවරයා

5. ප්‍රසාද ස්නාපනයේ දී පාපයට මිය යාම හා වරප්‍රසාදිය ජීවිතයකට උත්ථාන වීම සංකේතවත් කරමින් භාවිතා කරන බාහිර සලකුණ වන්නේ,
   i. සුදු වස්ත්‍රය යි.
   ii පාස්කු ඉටිපහන යි.
   iii. ක්‍රිස්මා තෙලය යි.
   iv. ජලය යි.

6. එක් වරක් පමණක් ලැබිය හැකි දේව ප්‍රසාද නිධාන අඩංගු වරණය වන්නේ,
   i. ප්‍රසාද ස්නාපනය/ දිව්‍ය සත්ප්‍රසාදය/ රෝගීන්ගේ ආලේපය
   ii දිව්‍ය සත්ප්‍රසාදය/ අභිවෘද්ධි ආලේපය/ පූජකවරය
   iii. පාපොච්චාරණය/ අභිවෘද්ධි ආලේපය/ රෝගීන්ගේ ආලේපය
   iv. ප්‍රසාද ස්නාපනය/ අභිවෘද්ධි ආලේපය/ පූජකවරය

7. "මිනිසා තනි ව විසීම සුදුසු නැත; ඔහුට සුදුසු සහකාරියක මවා දෙන්නෙමි." යි සඳහන් වන ශුද්ධ බයිබලීය ග්‍රන්ථය කුමක් ද?
   i. උත්පත්ති
   ii නික්මයාම
   iii. ශු. ලූක් සුවිශේෂය
   iv. එළිදරව්ව

8. ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වන ණය මංගල්‍යය දිනයකි,

i. මරිය තුමිය එලිසබෙත් තුමය බැහැදැකීමේ මංගල්‍යය

ii කානික්ක මංගල්‍යය

iii. මරිය තුමියගේ උපන් මංගල්‍යය

iv. පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය

9. දුක වේදනාව, තනිකමට පිළිතුරු සොයා ගත නොහැකි ප්‍රශ්න හමුවේ අපට පිළිතුරු සොයා ගත හැකි මාර්ගය වනුයේ,

i. බලාපොරොත්තුවෙන් ජීවත් වීමයි.

ii. යාච්ඤා කිරීම යි.

iii. අංජනම් එළි බැලීම යි.

iv. යාග පූජා පුද කිරීම යි.

10. ලොව ප්‍රතිසංස්කරණයට, ශුද්ධ ත්‍රිත්වය භාවිතා කරන ආයුධය ........................................ ලෙස මරිය තුමිය, දොමිනික් පියතුමාට පවසන ලදි. මෙහි හිස්තැනට සුදුසු වරණය වනුයේ,

i. ශුද්ධ වූ පැය

ii. ජපමාල භක්තිය

iii පාද නමස්කාරය

iv. දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව (ල. 2×10=20)

● අංක 11-15 දක්වා ඇති ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.
(ආත්ම දමනය/ ගැලවීමේ ඉතිහාසය/ නිවැරදි ඉරියව්/ සිලු අවශ්‍යතා/ දේව ජීවිතය)

11. ශුද්ධ බයිබලයේ ........................................ පිළිබඳ ව තොරතුරු ඇතුලත් වේ.

12. දෙවියන් වහන්සේ මුළු විශ්වය නිර්මාණය කිරීමේ දී මිනිසාගේ ........................................ ගැන සැලකිලිමත් වූ සේක.

13. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මඟින් ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය ලබා ගැනීම තුළින් අපගේ ........................................ පෝෂණය වේ.

14. ........................................ එක්වරු ශීලය රැකීමේ පරමාර්ථයකි.

15. යාච්ඤා උච්චාරණයේ දී ........................................ භාවිතා කළ යුතු ය. (ල. 2×5=10)

● අංක 16-20 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි නම් ( √ ) ලකුණ ද, වැරදි නම් වැරදි ( X ) ලකුණ ද යොදන්න.

16. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ ක්‍රිස්තුන් වහන්සේ ඉපදීමට පෙර යුගය ගැන විස්තර වේ. ( )

17. අප පුද්ගල විවිධත්වයට ගරු නොකළ යුතු ය. ( )

18. ශාරීරික සුවය ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාදයකි. ( )

19. රෝගී වූ විට නිසි ප්‍රතිකාර ගැනීමට පස්වන දේව පනතින් අපට නියම වේ. ( )

20. පැරණි ගිවිසුමේ සඳහන් යැදුම් පොත වන්නේ ගීතාවලිය යි. ( )

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. i. උත්පත්ති පොතේ ඇතුළත් කරුණු 2 ක් ලියන්න.
ii. සුවිශේෂක ජොහාන් තුමාගේ දෙමාපියන් නම් කරන්න.
iii. මිනිසා අන් මැවිලිවලට වඩා උසස් වීමට හේතු 2 ක් ලියන්න.
iv. ජුදා ජාතිකයන්ගේ ආගමික හා ජාතික චාරිත්‍ර 2 ක් ලියන්න.
v. රෝගීන්ගේ ආලේපය නමැති දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද 2 ක් ලියන්න.
vi. සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන 2 ක ලියන්න.
vii. දෙවියන් වහන්සේට නමස්කාර කිරීමට අපට උගන්වන පනත් 2 ක් ලියන්න.
viii. නොකඩවා අධෛර්යයට පත් නොවී යාච්ඤා කළ යුතු බව ක්‍රිස්තුන් වහන්සේ පෙන්වා දුන් උපමා 2 ක් ලියන්න.
ix. යාච්ඤාවක ඇතුළත් විය යුතු ප්‍රධාන ලක්ෂණ 2 ක් ලියන්න.
x. පොදු යැදුම් වල ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 2×10=20)

02. i. දෙවියන් වහන්සේ ලෝකය මවා මිනිසාට පැවරූ වගකීම් 2 ක් ලියන්න.
ii. දේව මැවිල්ලෙන් මිනිසාට ඇති ප්‍රයෝජන 3 ක් ලියන්න.
iii. දේව මැවිල්ල ආරක්ෂා කර ගනිමින්, වර්ධනය කර ගැනීමට පාසල තුළ ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න. (ල. 2+3+5=10)

03. i. අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරමින් ජේසුස් වහන්සේ පැවසූ වදන් පෙළ ලියන්න.
ii. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය නිසි ලෙස ලබා ගැනීමට අවශ්‍ය පියවර 3 ක් ලියන්න.
iii. රෝගී වූ කතෝලික අයෙකු වෙනුවෙන් ඔබට පැවරෙන වගකීම් 5 ක් ලියන්න. (ල. 2+3+5=10)

04. i. දෙමව්පියන් වෙනුවෙන් දරුවන්ගේ යුතුකම් හා වගකීම් දැක්වෙන ශුද්ධ ලියවිලි ග්‍රන්ථ 2 ක් ලියන්න.
ii. පෙන්තකොස්ත දින සිදු වූ විශේෂ සිදුවීම් 3 ක් ලියන්න.
iii. පූජාප්‍රසාදීතුමන්ලා වෙනුවෙන් කිවහැකි යැදුමක් ලියන්න. (ල. 2+3+5=10)

05. i. 7 හා 10 පනත් නම් කරන්න.
ii. පාස්කු අභිරහස යනු කුමක් ද?
iii. දිව්‍ය පූජාවට භක්තියෙන් හා ක්‍රියාකාරීව සහභාගී වීමට ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න. (ල. 2+3+5=10)

6. i. යාච්ඤාව යනු කුමක් ද?
ii. කිතුනු අප යාච්ඤා කිරීමේ දී භාවිතා කරන ඉරියවු 3 ක් ලියන්න.
iii. යාච්ඤා කරන විට අප තුළ තිබිය යුතු ගුණාංග 5 ක් ලියන්න. (ල. 2+3+5=10)

7. i. ස්වාමිවාක් ආරාධනාවේ ප්‍රශංසාත්මක පැතුම් 2 ක් ලියන්න.
ii. "නමෝ මරිය" යැදුමේ කොටස් 3 නම් කරන්න.
iii. ඔබ එදිනෙදා යාච්ඤා කරන අවස්ථා 5 ක් ලියන්න. (ල. 2+3+5=10)